| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය Grade } 09 | විෂයය Subject } ඉතිහාසය | පත්‍රය Paper } I | කාලය Time } පැය 02යි |

නම .......................................................................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

පහත අංක 01 සිට 05 දක්වා ඇති සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ වල ආධිපත්‍යය ඉංග්‍රීසි ජාතිකයන්ට පවරා දීමට අදාළ ලියවිල්ල ඕලන්ද ජාතිකයන් විසින් සකසනු ලැබුවේ,**

1. බකිංහැම් මාළිගයේදී ය
2. කියු මාළිගයේදී ය
3. වෙස්ට්මිනිස්ටර් මාළිගයේදී ය
4. කොන්සිස්ටන් මාළිගයේදී ය

02) **ක්‍රි. ව 1797-1798 වසර වල මුහුදුබඩ වැසියන් විසින් ඉංග්‍රීසි වෙළඳ සමාගමේ පාලනයට විරුද්ධව ඇති කළ කැරැල්ල පිළිබඳව සොයා බැලීමට පත් කළ කොමිසම වන්නේ,**

1. කෝල්බෲක්
2. ඩොනමෝර්
3. ද මියුරන්
4. සෝල්බරි

03) **ක්‍රි.ව 1815 දී ඉංග්‍රීසින්, උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර, ඔසවන ලද ඉංග්‍රීසි ධජය බිම දමා සිංහල ධජය එස වූ භික්ෂූන් වහන්සේ නම්,**

1. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
2. වාරියපොළ ශ්‍රී සුමංගල හිමි
3. වස්කඩුවේ සුභූති හිමි
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

04) **කෝට්ටේ සිංහයා යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන මෙරට නිදහස් සටනට සම්බන්ධ නායකයා,**

1. E.W පෙරේරා
2. A.E ගුණසිංහ
3. D.S සේනානායක
4. D.B ජයතිලක

05) **ක්‍රි.ව. 1915 දී ඇතිවුණු සිංහල - මුස්ලිම් කෝලහාල සමයේ මෙරට සිටි ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා නම්,**

1. විලියම් ග්‍රෙගරි
2. ස්ටුවර්ට් මැකෙන්සි
3. හර්කියුලිස් රොබින්සන්
4. රොබට් චාමර්ස්

**පහත දි ඇති වාක්‍ය වල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

06) ............................................... ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ලෙස සැළකේ. (තෝමස් මෙට්ලන්ඩ්, ෆ්‍රෙඩ්රික් නෝර්ත්, රොබට් බ්‍රවුන්රිග් )

07) ක්‍රි. ව 1798 දී ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් සිහසුනට පත් වුයේ ......................................... නම් වූ නායක්කාර වාංශික කුමාරයා ය. (කන්නසාමි ,දොරේසාමි, මුත්තු සාමි)

08) ශ්‍රී ලාංකිකයන්ට සීමිත ඡන්ද බලය හිමි වුණේ ............................................. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙනි. (මැනිං, මැකලම්, සෝල්බරි )

09) ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති ධුරය දැරුවේ, ........................................ මහතා ය.
( පොන්නම්බලම් රාමනාදන්, ඩී.එස්.සේනානායක, පොන්නම්බලම් අරුණාචලම් )

10) 1815 න් පසු උඩරට පාලන කටයුතු ගෙන යාමට නිත්‍ය නේවාසික ධුරයට .................................. යන අය පත් කරන ලදී ( මැක්ඩෝවල්, ජෝන් ඩොයිලි, හියු බොයිඩ් )

**ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් A හා B තීරු යටතේ දී ඇති කොටස් කියවා ගැලපෙන සේ යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11) | ඒ.ඊ ගුණසිංහ | සිංහල නවකතා ලිවීම |
| 12) | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | මද්රාසා පාසල් ප්‍රතිසංවිධානය කිරීම |
| 13) | පියදාස සිරිසේන | පානදුරාවාදයට නායකත්වය දීම |
| 14) | සිද්දි ලෙබ්බේ තුමා | තරුණ බෞද්ධ සංගමය පිහිටුවීම |
| 15) | ඩී.බී ජයතිලක | කම්කරු ව්‍යාපාරයේ පියා ලෙස හැඳින්වීම |

**ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ඇති ප්‍රකාශ සත්‍ය නම් ( √ ) ලකුණද අසත්‍ය නම් ( × ) ලකුණද ඉදිරියෙන් යොදන්න,**

16) ශ්‍රී ලංකාවේ ආධිපත්‍යය ලබා ගැනීමේදි ප්‍රංශය හා බ්‍රිතාන්‍ය යන දෙපක්ෂයම ත්‍රිකුණාමල වරාය කෙරෙහි අවධානය යොමු කරන ලදී. ( )

17) ශ්‍රී ලංකාවේ අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා විලෙම් ෆල්ක් වේ. ( )

18) ක්‍රි. ව 1848 ඉංග්‍රීසි විරෝධි කැරැල්ලට නායකත්වය දුන් වීරපුරන් අප්පු, පැලියගොඩ දොන් ඩේවිඩ් යන නමින්ද හැඳින්වේ. ( )

19) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන්ගේ ඡන්දයෙන් පත් කර ගත යුතු වූ කථා නායක ධුරය සඳහා ප්‍රථම වරට ඒ. එෆ්. මොලමුරේ මහතා පත් කරනු ලැබීය. ( )

20) යාපනය ඇතුළු උතුරු ප්‍රදේශවල අධ්‍යාපන කටයුතු මෙහෙය වූ මිෂනාරි සමාගම ඇමරිකන් මිෂනාරි සමාගමයි. ( )

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය / Grade } 09 | විෂයය / Subject } ඉතිහාසය | පත්‍රය / Paper } II | |

නම ..........................................  විභාග අංකය ......................

සැළකිය යුතුයි:

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01) 1. බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීමට අවශ්‍ය වූ ප්‍රධාන කරුණු 02ක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

2. උඩරට රාජ්‍යය, යටත් කර ගැනීමට අවශ්‍ය වුයේ ඇයිදැයි කරුණු 04ක් ලියන්න. ( ලකුණු 04 )

3. ක්‍රි. ව 1803 දී ඉංග්‍රීසින් උඩරටට එල්ල කළ ප්‍රථම ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු 02ක් පැහැදිලි කරන්න ( ලකුණු 06 )

02) 1. ක්‍රි. ව. 1797 දී ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමට විරුද්ධව, ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව කැරලි ගැසීමට හේතු වු කරුණු 02ක් ලියන්න. ( ලකුණු 02 )

2. මුහුදුබඩ වැසියා ඇති කළ ඉහත කැරැල්ලට මුල් වූ හේතු සොයා බලන්නට පැමිණි කොමිසම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 04ක් ලියන්න. ( ලකුණු 04 )

3. ද්විත්ව පාලනය යනු කුමක්දැයි හඳුන්වා එය අසාර්ථක වුයේ අයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

03) 1. ක්‍රි.ව 1818 බ්‍රිතාන්‍ය විරෝධි නිදහස් අරගලයට බලපෑ ප්‍රධාන හේතු 02ක් සඳහන් කරන්න ( ලකුණු 02 )

2. ක්‍රි.ව 1818 දී ඇති වූ සිංහලේ පළමු නිදහස් සටනට නායකත්වය දුන් සිව්දෙනෙකු නම් කරන්න. ( ලකුණු 04 )

3. 1818 නිදහස් සටන අසාර්ථක වීමට හෙවත් උඩරටියන් පරාජය වීමට බලපෑ හේතු 03ක් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 06 )

04) 1. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් පවතින රටක පාර්ලිමේන්තුවට අයත් කාර්යයන් 02ක් සඳහන් කරන්න. ( ලකුණු 02 )

2. පහත a හා b යටතේ දක්වා ඇති වර්ෂ වලදී මෙරට ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙළින් නම් කරන්න.
a - 1910
b - 1920 ( ලකුණු 04 )

3. 1931 දී මෙරටට හඳුන්වා දෙනු ලැබු ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන යෝජනා 02ක් විස්තර කරන්න ( ලකුණු 06 )

05) 1. බ්‍රිතාන්‍ය පාලන අවධියේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි සමාගම් 02ක් නම් කරන්න.
( ලකුණු 02 )

2. පහත A, B, C, D යන කරුණු වලට අදාළ ගිහි පැවිදි නායකයින් පිළිවෙලින් නම් කරන්න.

A - රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙන ආරම්භ කිරීමට මුලිකත්වය ගැනීම.
B - ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය ධූරය දැරීම
C - ලංකා සම සමාජ පක්ෂයේ ආරම්භක නායකත්වය දැරීම
D - ලංකාලෝකය පුවත්පත හා සුමති සංග්‍රහය සඟරාව ආරම්භ කිරීමට මුල් වීම
( ලකුණු 04 )

3. ඇමරිකානු ජාතික හෙන්රි ස්ටිල් ඕල්කට් තුමාගෙන් මෙරට ජනතාවට සිදු වූ සේවය කරුණු 03ක් ඇසුරින් පැහැදිලි කරන්න.
( ලකුණු 06 )

06) 1. ලංකා ජාතික සංගමය බිහිවීමට පෙර ශ්‍රී ලංකිකයන් දේශපාලන බලතල ලබා ගැනීමේ අරමුණින් පිහිටුවා ගත් සංවිධාන 02ක් නම් කරන්න.
( ලකුණු 02 )

2. බ්‍රිතාන්‍ය රජය විසින් 1912 දී පනවන ලද සුරාබදු පනතට විරුද්ධව මෙරට අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කිරීමට මුල් වූ නායකයන් සිව් දෙනෙක් නම් කරන්න.
( ලකුණු 04 )

3. අප රටට නිදහස දිනා ගැනීමට මුල් වී ක්‍රියා කළ නායකයන් අතරින් පහත සඳහන් නායකයින් දෙදෙනෙකු පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

a - අනගාරික ධර්මපාලතුමා
b - ඩී.එස්. සේනානායක මහතා
c - පොන්නම්බලම් රාමනාදන් මහතා
d - ඩී.බී. ජයතිලක මහතා
e - ටී. බී ජයා මහතා
( ලකුණු 06 )

07) 1. ක්‍රි.ව 1947 පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූ දේශපාලන පක්ෂ 02ක් නම් කරන්න
( ලකුණු 02 )

2. 1947 දී පිහිට වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය පිහිටුවීමේ අරමුණු 2ක් ලියන්න
( ලකුණු 04 )

3. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාගෙන් මෙරට නිදහස් අධ්‍යාපනයට සිදු වූ සේවය කරුණු 03ක් ඇසුරින් විස්තර කරන්න.
( ලකුණු 06 )